Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂයඃ- පෙරදිග සංගීතය

අගෝස්තු 04 සතිය

ශ්‍රේණිය :- 10

Prepared by- K.L.R.T. Kurulugama
(Music Teacher:- Ke/Dehi/Waharaka M.V.)

නිපුණතා මට්ටමඃ-7.2 හිංදුස්ථානි තාල පද හා සම්බන්ධ අවනද්ධාක්ෂර තබ්ලාවෙන් නිකුත් වන අයුරු විමර්ශණය කරමින් ප්‍රායෝගිකය අධ්‍යනය කරයි.

- පහත කියවීම් පත්‍රිකාවේ ඇි තොරතුරු කියටා අවබෝධ කරගන්න

**ඇමුණුම 02 :**

දායාවෙන් උපදින අක්ෂර

| අක්ෂරය | උපදින ස්ථානය |
|---|---|
| ති | ස්‍යාහි කොටසේ මැදට මහපට ඇඟිල්ල හා දබරැඟිල්ල හැර ඉතිරි ඇඟිලි තුනෙන් එකවර තැළීමෙන් උපදී. |
| ට | ස්‍යාහි කොටසේ හරි මැදට දබර ඇඟිල්ලෙන් පමණක් තැළීමෙන් උපදී. |
| ඊ | "ට" අක්ෂරය උපදින ස්ථානයෙන් ම "ඊ" අක්ෂරය උපදී. (වාදනය වන අවස්ථාව අනුව "ට" අක්ෂරයම "ඊ" අක්ෂරය ලෙස හැඳින්වේ. |
| තුං | දබරැඟිල්ලෙන් ස්‍යාහි කොටසට විවෘතව තැළීමෙන් "තුං" අක්ෂරය උපදී. |
| න | දායාවේ චාන්ටි කොටසට දබරැඟිල්ලෙන් තැළීමෙන් "න" අක්ෂරය උපදී. මෙහි දී වෙදැඟිල්ල ස්‍යාහි කොටසේ රඳවා තබා ගත යුතු ය. |
| ත | "න" අක්ෂරය උපදින ස්ථානයෙන්ම දබරැඟිල්ලෙන් තැළීමෙන් "ත" අක්ෂරය උපදී. මෙහි දී ද වෙදැඟිල්ල ස්‍යාහි කොටසේ රඳවා තබා ගත යුතු ය. |
| තිං | ලවයට තැළීමෙන් "තිං" අක්ෂරය උපදී. |
| තිත් | ති අක්ෂර උපදින ආකාරයටමය. |

<u>ක්‍රියාක</u>

බායාවෙන් උපදින අක්ෂර

| අක්ෂරය | උපදින ස්ථානය |
|---|---|
| ක | බායාවේ මුහුණතට වම් අත ඇඟිලි සියල්ල දිග හැර අල්ල ද සමග එකවර වදින සේ තැළීමෙන් "ක" උපදී. මෙහි දී ක්‍රියාකාරී වන්නේ අතේ මැණික් කටුවෙන් ඉහළ කොටසයි. |
| කි | ඉහත ආකාරයෙනි. |
| කත් | ඉහත ආකාරයට ම අත ඔසවා තදින් තැළීමෙන් "කත්" උපදී. මෙහි දී අතේ වැලමිටෙන් ඉහල කොටස ක්‍රියාත්මක වෙයි. |
| ග | වම් අතෙහි මැදැඟිල්ල හා දබරැඟිල්ල යන ඇඟිලි දෙකෙන් එකකින් ලවය කොටසට තැළීමෙන් "ග" උපදී. |
| ග | 'ග' අක්ෂරය නිෂ්පත්තියේ දී වාදකයා අතට යොදන බර වෙනස් කිරීමෙන් ගෙ, ගි, ගිං, ගෙං, ගො යන අක්ෂර නිපදවා ගනී. |

දායාවේ හා බායාවේ අක්ෂර එකතුවෙන් උපදින අක්ෂර

| අක්ෂරය | උපදින ස්ථානය |
|---|---|
| ධා | බායාවේ "ගෙ" අක්ෂරයත් දායාවේ "න" අක්ෂරයත් යන දෙක එකවර වැයීමෙන් උපදී. |
| ධිං | බායාවේ "ගෙ" අක්ෂරයත් දායාවේ "තිං" අක්ෂරයත් එකවර වැයීමෙන් උපදී. |
| ධි | බායාවේ "ගෙ" අක්ෂරයත් දායාවේ "ති" අක්ෂරයත් එකවර වැයීමෙන් උපදී. |